**බෞද්ධ හිමිකම් කොමිෂන් සභාව ...................**

නිර්මල ථේරවාදී බුදු දහම සියවස් 25 ක් පමණ සුරක්ෂිතව රැක ගනිමින් විදේශීය බලපෑම් වලින් මිදෙමින් සම්බුද්ධ ශාසනයේ පුනර්ජීවනයක් ඇති කිරීම සඳහා ක්‍රියා කළ සියලු බෞද්ධ සංවිධාන ඒකරාශී කර ගනිමින් 1919 වර්ෂයේ දී ශ්‍රීමත් ඩී.බී.ජයතිලක මැතිතුමන් ප්‍රමුඛ පුරෝගාමීන් විසින් ආරම්භ කරන්නට යෙදුන සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය සිය ප්‍රමුඛතම කාර්ය කොට සළකනුයේ සම්බුද්ධ ශාසනයේ ආරක්ෂාව හා චිරස්ථිතියයි.

දැනට වසර 2325 කට වඩා පැරණි බෞද්ධයනගේ උරුමය හා අයිතිවාසිකම් අනාගතය වෙනුවෙන් කෙසේ සකස් විය යුතුද, ආරක්ෂා විය යුතුද යන්න පිළිබඳව සළකා බලමින් 1955 අංක 24 දරණ සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය නීතිගත කිරීමේ පනතේ 03 වන වගන්තියෙන් ප්‍රකාශිත සම්බුද්ධ ශාසනයේ හා බෞද්ධයන්ගේ අභිවෘද්ධිය සැළසීම, බෞද්ධයන්ගේ ගෞරවය හා අයිතිවාසිකම් රැක ගැනීම ආදී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී බුද්ධ වර්ෂ 2562 ක් වූ පොසොන් මස පුර පසළොස්වක පොහෝ දින ඓතිහාසික මිහින්තලා පුද බිමේ ඉපැරණි ධාතු මන්දිර මළුවේදී මහා සංඝ රත්නයේ ආශිර්වාදයෙන් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් බෞද්ධ හිමිකම් කොමිෂන් සභාව ස්ථාපිත කරන ලදී.

සියලු ආගම් හා ලබ්ධීන් අදහන්නන් හා ජාතීන්ට අයත් පුරවැසියන් හා තැනැත්තන් සමඟ ද ජාත්‍යන්තර ප්‍රජාව සමඟ ද සහජීවනය හා විශ්වාසය වඩාත් තහවුරු කර ගත් මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා යන උතුම් ධර්මතාවයන් මත පදනම් වූ ශක්තිමත් පරමාධිපත්‍ය බිඳී නොගිය ජනතාවක් සහිත ශ්‍රී ලංකාවක් අනාගත පරම්පරාවට සුරක්ෂිත කර දීම මෙහි අරමුණයි.

ත්‍රෛනිකායික මහ නාහිමිවරුන් ඇතුලු මහා සංඝ රත්නයේ ආශිර්වාදයෙන් ආරම්භ කරන්නට යෙදුනු බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවේ ගරු සභාපති ලෙස හිටපු නීතිපති ජනාධිපති නීතිඥ පාලිත ප්‍රනාන්දු මැතිතුමා, ගරු ලේකම් ලෙස විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ වර්තමාන ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමාත් පත් කර ගන්නා ලදී. කොමසාරිස්වරුන් 21 දෙනෙකුගෙන් සමන්විත මෙම කොමිෂන් සභාවේ මංගල රැස්වීම 2018 ජූලි මස 10 වන දින සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේදී පවත්වන්නට යෙදුනි. 2018 ජුනි මස 27 දා සිට 2020 පෙබරවාරි මස 28 වන දින දක්වා මෙම කොමිෂන් සභාව සමස්ත බෞද්ධ ජනතාවගෙන් සහ ශ්‍රී ලංකාවාසී සමස්ත ජනතාවට සිය අදහස්, යෝජනා, තොරතුරු හා පැමිණිලි ලිඛිතව ඉදිරිපත් කිරීම සඳහා ද ආරාධනා කර සිටි අතර වාචික සාක්ෂා ලබා දීම ඒ අනුව සිදු විය. ගරුතර මහ නායක මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන පූජණීය වන්දනීය මහා සංඝ රත්නය පෙරටු කොට ගත් ගිහි බෞද්ධ සංවිධාන ඇතුළු බොහෝ දෙනෙක් උනන්දුවකින් කොමිෂන් සභාව

සඳහා සාක්ෂා ලබා දීමට කටයුතු කරන ලදී. ඒ අනුව පුද්ගලයන් වශයෙන් වාචික සාක්ෂා/ඉදිරිපත් කිරිම් 327 දෙනෙකුත්, සංවිධාන වශයෙන් 110 කුත් ලිඛිත සාක්ෂා ඉදිරිපත් කිරීම් 50 කුත් ඒ අතර විය.

මෙහිදී මූලික වශයෙන් විෂයයන් 09 ක් ඔස්සේ සාක්ෂා ලබා ගැනීම සිදුවිය.

<u>විෂයයන්</u>

01 බුද්ධ ශාසනය බෞද්ධ හිමිකම සහ ,ආගමික සහජීවනය.
02 ඓතිහාසික පුරාවිද්‍යා උරුමය.
03 නීතිය සහ රාජ්‍ය පාලනය , ජාතික ආරක්ෂාව හා විදේශ ප්‍රතිපත්ති.
04 සමජීවිකතාව සහ ආර්ථිකය.
05 අධ්‍යාපනය, සදාචාරය සහ පුරවැසියා.
06 භාෂාව, සංස්කෘතිය හා ජාතික අනන්‍යතාවය.
07 සෞඛ්‍ය, ආහාර හා පෝෂණය, වෙදකම.
08 තාක්ෂණය, විද්‍යාත්මකක්‍රම.
09 පරිසරය, ස්වාභාවික සම්පත්.

<u>ගරු කොමසාරිස්වරු</u>

1. විශ්‍රාමලත් නීතිපති, ජනාධිපති නිතිඥ පාලිත ප්‍රනාන්දු මැතිතුමා

2. විශ්‍රාමලත් හමුදාපති, ජනරාල් ආර්.එම්.ඩී. රත්නායක මැතිතුමා

3. විශ්‍රාමලත් මිනුම්පති ඩබ්.කේ.එම්. සිල්වා මැතිතුමා

4. විශ්‍රාමලත් බාලදක්ෂ කොමසාරිස් වාස්තු විද්‍යා මහාචාර්ය නිමල් ද සිල්වා මැතිතුමා

5. ජනාධිපති නිතිඥ මනෝහර ද සිල්වා මැතිතුමා

6. ජනාධිපති නීතිඥ ප්‍රසන්ත ලාල් ද අල්විස් මැතිතුමා

7. විකලාංග ශල්‍ය වෛද්‍ය විශේෂඥ නරේන්ද්‍ර පින්ටෝ මැතිතුමා

8 මහාචාර්ය මාලනී ඇඳගම මැතිතුමිය

9. මහාචාර්ය මාලිංග අමරසිංහ මැතිතුමා

10 ආචාර්ය පාලිත කොහොන මැතිතුමා

11 ආචාර්ය ශාන්තිකුමාර හෙට්ටිආරච්චි මැතිතුමා

12. ආචාර්ය ඉනෝකා ප්‍රියදර්ශණී කුඩාවිදානගේ මැතිතුමිය

13. ආචාර්ය හර්ෂ විජෙවර්ධන මැතිතුමා

14. විශ්‍රාමලත් බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ලේකම් එම්.කේ.බී.දිසානායක මැතිතුමා

15 මාධ්‍යවේදී ශ්‍යාම් නුවන් ගනේවත්ත මැතිතුමා

16. විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමා.

**2020.02.28 දක්වා කරන ලද සාක්ෂි විමසීම් – දිස්ත්‍රික්ක සහ පළාත් වශයෙන්**

| | පළාත | දිස්ත්‍රික්ක | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | බස්නාහිර | කළුතර | කොළඹ | ගම්පහ | | |
| 2 | සබරගමුව | රත්නපුර | කෑගල්ල | | | |
| 3 | දකුණ | ගාල්ල | මාතර | හම්බන්තොට | | |
| 4 | වයඹ | කුරුණෑගල | පුත්තලම | | | |
| 5 | ඌව | බදුල්ල | මොණරාගල | | | |
| 6 | මධ්‍යම | මහනුවර | මාතලේ | නුවරඑළිය | | |
| 7 | උතුරු මැද | අනුරාධපුරය | පොළොන්නරුව | | | |
| 8 | උතුර | යාපනය | මන්නාරම | කිළිනොච්චිය | මුලතිව් | වව්නියාව |
| 9 | නැගෙනහිර | අම්පාර | මඩකලපුව | ත්‍රිකුණාමලය | | |

ප්‍රාදේශීය සාක්ෂි විමසීම්

සම්මේලනයේ සාක්ෂි විමසීම්

සම්මේලනයේ සහ ප්‍රාදේශීය වශයෙන් සාක්ෂි විමසීම්

පරිච්ඡේද 10 කින් හා නිර්දේශ 240කින් සමන්විත බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවේ වාර්තාව ශ්‍රී බු.ව. 2564 ක් වූ දුරුතු මස 29 වන දින සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ බී.එච්. විලියම් ශාලා පරිශ්‍රයේදී සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ එවකට ගරු සභාපති වශයෙන් කටයුතු කළ ජගත් සුමතිපාල මැතිඳුන් වෙත , ජාතියට පිළිගැන්වීම සඳහා භාර දෙනු ලැබිණි.

පැවති බාධක මැඩළමින් මෙම උදාර කර්තව්‍ය සාර්ථක කර ගත හැකි වූයේ, බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් කටයුතු කරන ලද, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ වත්මන් සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මහතාගේ අප්‍රතිහත ධෛර්ය මෙන්ම එතුමාට සැමවිටම සහයෝගය දක්වමින් අත්වැලක් වූ බෞද්ධ මහා සම්මේලනයේ වර්තමාන සමලේකම්වරයෙකු වන බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවේ කාර්යාලයේ මෙහෙයුම් කටයුතු ඉටු කරන ලද ඉෂාන් බුද්ධික එදිරිසූරිය මහතාගේ කැපවීමෙනි.

පාස්කු ප්‍රහාරය හා කෝවිඩ් වසංගතය හමුවේ ඇති අභියෝග මධ්‍යයේ වුවද මෙම කොමිෂන් සභා වාර්තාව, හුදෙක් තවත් එක් වාර්තාවකට සීමා නොවී, මෙහි සඳහන් නිර්දේශ, දේශීය

විදේශීය වශයෙන් ඇති අභියෝගයන් ජය ගැනීමට ක්‍රියාත්මක කළ යුතු බවට සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපතිතුමා තුළ වූ අධිෂ්ඨානය යථාර්තයක් බවට පත් කිරීමට ගරු කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය අනුව අදාළ කර ගත් විෂයයන් 09 ට සමගාමීව කමිටු 09 ක් ස්ථාපිත කර අදාළ විෂයන්හි විශේෂ නිපුනත්වයක් දක්වන විද්වතුන් එක්රැස් කර එය ජාතික ක්‍රියාන්විතයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලික සැළසුම් මේ වන විට කෙටුම්පත් කරමින් පවතී.

එසේම කොමිෂන් සභාවක් වශයෙන් මෙවර බෞද්ධ හිමිකම් කොමිෂන් සභාවේ තවත් විශේෂත්වයක් වනුයේ කොමිසම සඳහා ලබා දුන් සාක්ෂ්‍ය මුද්‍රිත මාධ්‍ය සහ විද්‍යුත් මාධ්‍ය යන දෙආකාරයෙන්ම සකස් කිරීමයි.

ලි/MR/17/28/08/2021